(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 1(9).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 පෙබරවාරි 11 අඟහරුවාදා**

2025 මාර්තු 07 සිකුරාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

154/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම පිහිටුවා ඇති "තම්බපවනී" සුළං විදුලි බලාගාරයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ඉදිකිරීම් සඳහා භාවිතා කරන ලද දේශීය ආයෝජන ප්‍රමාණය සහ විදේශීය ආයෝජන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම බලාගාරයේ ධාරිතාවය (Installed Capacity) කොපමණද;

(iv) එම බලාගාරයේ විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(v) වර්ෂ 2021 සිට 2024 දක්වා එම බලාගාරය මඟින් ජාතික විදුලිබල පද්ධතියට එක් කරන ලද බලශක්ති ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත විදුලි බලාගාරය හේතුවෙන් සංක්‍රමණික කුරුල්ලන්ට සිදු වන හානි වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) එම පියවරවල සාර්ථකත්වය කෙබඳුද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මන්නාරම දූපතේ තවත් සුළං විදුලි බලාගාර ඉදිකිරීමට විභවයක් තිබේද;

(ii) එසේ නම්, එම සුළං විදුලි බලාගාරවල ධාරිතාවය කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

253/2024

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(ii) එම ප්‍රමාණය එක් එක් ග්‍රාම නිලධාරි වසම් අනුව වෙන් වෙන් වශයෙන් හෙක්ටයාර්වලින් කොපමණද;

(iii) එම ඉඩම්වලින් දෙවැනි පාර්ශ්වයන් වෙත ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(iv) එම එක් එක් දෙවැනි පාර්ශ්වයේ නම, එම පාර්ශ්වයට ඉඩම් ලබා දී ඇති ස්ථානය සහ ලබා දී ඇති පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් නොවන, රජයේ ඉඩම් පිහිටි ස්ථාන හා ප්‍රමාණයන් හෙක්ටයාර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ මේ වනවිට හඳුනාගෙන ඇති කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(iii) එම ඉඩම් අතරින් මේ වනවිට වගා කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

292/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ පැවති අධික වැසි නිසා ඇති වූ ජල ගැලීම් හේතුවෙන් පුත්තලම මූලික රෝහලේ නේවාසික වාට්ටු, බාහිර රෝගී අංශ, සායන ඇතුළුව රෝහල් පරිශ්‍රය ජලයෙන් යට වූ බවත්;

(ii) එම රෝහලේ අපජලය බැහැර කිරීමට සහ වැසි ජලය බැස යෑමට කාණු පද්ධතියක් නොමැති බවත්;

(iii) රෝගීන්ට ප්‍රතිකාර ලබා දෙන රෝහල් පරිශ්‍ර වඩාත් සුරක්ෂිතව පවත්වාගෙන යා යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත රෝහල් පරිශ්‍රය වඩාත් සුරක්ෂිතව පවත්වාගෙන යාම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

304/2024

ගරු රවී කරුණානායක මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු සහ පෞද්ගලික සමාගම් සතු එක් එක් පර්යන්තයට පැමිණි නැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී කාල සීමාව තුළ එම එක් එක් පර්යන්ත විසින් මෙහෙයවන ලද බහාලුම් සංඛ්‍යාව කොපමණද;

(iii) එකී කාල සීමාව තුළ එම එක් එක් පර්යන්තය ලැබූ මෙහෙයුම් ලාභය කොපමණද;

(iv) එකී කාල සීමාව සඳහා අධිකාරිය විසින් උපයන ලද ආදායම සහ ලාභය කොපමණද;

(v) ඉහත අංක (i) හි සඳහන් එක් එක් පර්යන්තය විසින් පැයකට මෙහෙයවන ලද බහාලුම් සංඛ්‍යාව අනුව එම එක් එක් පර්යන්තයේ කාර්යක්ෂමතාවය කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ මෙහෙයවන ලද මුළු බහාලුම් සංඛ්‍යාව සහ සාමාන්‍ය භාණ්ඩ ප්‍රමාණය (ටොන්වලින්) කොපමණද;

(ii) ඉදිරි වසර දහය තුළ මෙහෙයවීමට නියමිත ප්‍රක්ෂේපිත බහාලුම් සංඛ්‍යාව සහ සාමාන්‍ය භාණ්ඩ ප්‍රමාණය (ටොන්වලින්) කොපමණද;

(iii) පසුගිය වසර පහ තුළ බහාලුම් මෙහෙයවීම අනුව ශ්‍රී ලංකාවට ලැබී ඇති ලෝක ශ්‍රේණිගත කිරීම කවරේද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

492/2025

ගරු දේවානන්ද සුරවීර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ලියාපදිංචි ඖෂධශාලා සංඛ්‍යාව සහ ලියාපදිංචි ඖෂධවේදීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත අනුව ලියාපදිංචි ඖෂධශාලා, ලියාපදිංචි ඖෂධවේදියකුගේ අධීක්ෂණය යටතේ පවත්වා ගෙන යායුතු වන්නේද;

(iii) ලියාපදිංචි ඖෂධශාලා සංඛ්‍යාවට සාපේක්ෂව ලියාපදිංචි ඖෂධවේදීන්ගේ හිඟයක් පවතින බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම හිඟය මඟ හරවා ගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර සහ ඉදිරියේදී ගැනීමට නියමිත පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බාහිර ඖෂධවේදී විභාගයට පෙනී සිටීම සඳහා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමට අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු බව දන්නේද;

(ii) අවසන්වරට පවත්වන ලද බාහිර ඖෂධවේදී විභාගයට පෙනී සිටි 1,700ක් පමණ වන අයදුම්කරුවන් අතරින් අයදුම්කරුවන් 99ක් පමණක් සමත් වී ඇති අතර එම සංඛ්‍යාව විභාගයට පෙනී සිටි මුළු අයදුම්කරුවන්ගෙන් 6%ක් වැනි අඩු ප්‍රතිශතයක් බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2025 මාර්තු 08 සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

259/2024

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2022 සිට 2024 දක්වා කාලය තුළ දී හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සහභාගි වූ නිල විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් විදේශ සංචාරය කරන ලද රට, අරමුණ, ශ්‍රී ලංකාවට හිමි වූ ප්‍රතිලාභ, හිටපු ජනාධිපතිවරයාට අමතරව රජයේ වියදමින් සම්බන්ධ වූ පුද්ගලයන් සහ ඔවුන් සම්බන්ධ කර ගැනීමේ අරමුණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම විදේශ සංචාර සඳහා වැය කරන ලද සම්පූර්ණ වියදම කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

274/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අඹතලේ සිට ග්‍රෑන්ඩ්පාස් දක්වා දිවෙන මාර්ගය (පරණ පාර) සංවර්ධනය කිරීම සඳහා වැඩපිළිවෙළක් යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන දින වකවානු කවරේද;

(iii) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

381/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් පාසලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව, ගුරුවරුන් සංඛ්‍යාව සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ ඇති පළාත් සභා පාසල් සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් පාසලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව, ගුරුවරුන් සංඛ්‍යාව සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) පසුගිය රජය විසින් ජාතික පාසල් බවට පත් කර ඇති පළාත් සභා පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම පාසල් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

428/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, මූතූර් සහ කින්නියා රෝහල්වලට 'ඒ' ශ්‍රේණිය තත්ත්වය ලබා දී ඇති බවත්;

(ii) එහෙත්, 'ඒ' ශ්‍රේණියට සරිලන පරිදි එම රෝහල් සඳහා භෞතික සම්පත් මේ වනතෙක් ලබා දී නොමැති බවත්;

(iii) එම රෝහල්වලට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම රෝහල්වලට අවශ්‍ය භෞතික සම්පත් ලබා දීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) එම එක් එක් රෝහලේ මේ වනවිට සේවය කරනු ලබන විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝහල්වල කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) කින්නියා සහ මූතූර් රෝහල් මධ්‍යම රජය යටතට පවරා නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

444/2025

ගරු චානක මාදුගොඩ මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුල්මුඩේ, ලංකා ඛනිජ වැලි සමාගමට 2024.07.01 දින සිට අනියම් පදනම මත කම්කරු තනතුර සඳහා බඳවා ගන්නා ලද සේවකයන්ට මේ වනතෙක් කිසිදු වැටුපක් හෝ දීමනාවක් ගෙවා නොමැති බව දන්නේද;

(ii) ඔවුන්ට වැටුප්/දීමනා නොගෙවීමට හේතු කවරේද;

(iii) ඔවුන්ට වැටුප් ගෙවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2025 මාර්තු 10 සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

419/2025

ගරු අරුණ පනාගොඩ මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් පවරා ගැනීමේදී හා ඒවාට වන්දි ගෙවීමේදී පසුගිය ආණ්ඩුව විසින් ගන්නා ලද සමහර තීරණ හේතුවෙන් දැඩි ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ගැටලු විසඳීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

435/2025

ගරු දිනිඳු සමන් මහතා, — බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2020 සිට 2024 දක්වා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති අතරින් බදුල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා ඉල්ලීම ඉදිරිපත් කරන ලද පාර්ශ්වය, අනුමතිය ලබා දීමේදී සලකා බලන ලද සුවිශේෂ හේතු, වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

451/2025

ගරු පද්මසිරි බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) විනය හේතු මත හැර රජයේ ගුරුවරුන්ගේ ස්ථාන මාරු, ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය අනුව සිදු කරනු ලබන බව දන්නේද;

(ii) පසුගිය කාලයේදී ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය නිවැරදි ලෙස ක්‍රියාත්මක නොවූ බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කවරේද;

(iv) පසුගිය කාලයේදී රජයේ පාසල්වලට සිසුන් ඇතුළත් කර ගැනීමේදී විශාල ලෙස දූෂණ, වංචා සහ අක්‍රමිකතා සිදු කර ඇති බව දන්නේද;

(v) ඒවා වැළැක්වීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රායෝගික වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන පරිපාලන සේවයේ, අධ්‍යාපනඥ සේවයේ සහ විදුහල්පති සේවයේ බොහෝ පුරප්පාඩු පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම එක් එක් සේවාවේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

501/2025

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, හිනිදුම මැතිවරණ කොට්ඨාසයේ, i–road ව්‍යාපෘතිය අතරමඟ නවතා දැමීම හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව දැඩි පීඩාවකට පත් වී ඇති බව දන්නේද;

(ii) අතරමඟ නවතා දමා ඇති එක් එක් මාර්ගය සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන කවරේද;

(iv) එම එක් එක් මාර්ගය සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ගමනාගමනයට බාධාවක් නොවන ආකාරයෙන් එම මාර්ග පවත්වාගෙන යාම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

503/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තර සහ ඇල්පිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉඩම් ප්‍රමාණය, ඉහත ප්‍රදේශීය ලේකම් කොට්ඨාසවල එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම්වලින් කර්මාන්ත සහ වෙනත් ව්‍යාපෘති සඳහා ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් පුද්ගලයන් සඳහා ලබා දී තිබේ නම්, එම පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2025 මාර්තු 11 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

9/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ කුකුළු මස් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළදී කුකුළු මස් අපනයනය කර තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම කාල සීමාව තුළදී කුකුළු මස් ආනයනය කර තිබේද;

(v) එසේ නම්, එම ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ශ්‍රී ලංකාවේ කුකුළු මස් කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

462/2025

ගරු රුවන් මාපලගම මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අත්තනගල්ල, වතුපිටිවල ක්‍රීඩා සංකීර්ණයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද දිනය, වැඩ අවසන් කරන ලද දිනය සහ එය විවෘත කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ක්‍රීඩා සංකීර්ණයේ පිහිනුම් තටාකය, ගෘහස්ථ වොලිබෝල් ක්‍රීඩාංගනය, ප්‍රධාන ක්‍රීඩාගාරය, කාය වර්ධන මධ්‍යස්ථානය සහ ධාවන පථය ඉදිකරන ලද රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු සඳහා මේ වනවිට ගෙවා ඇති මුදල සහ ගෙවීමට ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ක්‍රීඩා සංකීර්ණයේ ඉදිකිරීම් නියමිත ප්‍රමිතියට අනුකූලව සිදුකර තිබේදැයි පරීක්ෂා කර තිබේද;

(ii) එසේ නම්, පරීක්ෂා කරන ලද දිනය සහ පරීක්ෂා කරන ලද්දේ කවුරුන්ද;

(iii) ඉදිකිරීම්වල සිදු වී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් එම ඉදිකිරීම් සිදු කරන ලද ආයතන විසින් වගකීම දරන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

482/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ අරාබි විද්‍යාල ලියාපදිංචි කර නඩත්තු කරන බවත්;

(ii) මවුලවි සහතිකය ලබා දීම සඳහා එම එක් එක් අරාබි විද්‍යාල වෙන වෙනම විභාග පවත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මවුලවි සහතිකය ලබා දීම සඳහා රජය විසින් පොදු විභාගයක් පැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

486/2025

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කහපොල පිහිටා ඇති 'රෙජිඩෙල් වත්ත' නමැති ඉඩම ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පවතින්නේද;

(ii) එම ඉඩමේ විශාලත්වය කොපමණද;

(iii) ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට එම ඉඩමේ සිදු කරනු ලබන කටයුතු කවරේද;

(iv) එම ඉඩම සම්බන්ධයෙන් ඉදිරි වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

509/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයට ආසන්නව හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලවේ ගඟ හරහා ලියන්ගස්තොට පාලම ඉදිකර ඇති බව දන්නේද;

(ii) එම පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය සහ අවසන් කිරීමට නියමිතව තිබූ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාලමේ ඇස්තමේන්තුගත වටිනාකම කොපමණද;

(iv) එවකට එම පාලමේ ඉදිකිරීම් භාරව කටයුතු කරන ලද අමාත්‍යාංශය/ආයතනය කවරේද;

(v) එය ඉදිකරන ලද කාලයේදී අදාළ අමාත්‍යාංශය භාරව සිටි අමාත්‍යවරයා කවුරුන්ද;

(vi) මේ වනවිට එම පාලමේ වැඩ අවසන් කර තිබේද;

(vii) එම පාලමේ ඉදිකිරීම් කටයුතු අතරමඟ නතර කර තිබේ නම්, ඒ හේතුවෙන් විනාශ වී ඇති ද්‍රව්‍ය කවරේද;

(viii) ඒවායේ වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

2025 මාර්තු 12 බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

74/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, පෝරතීවුපට්රු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පලුකාමම් ප්‍රදේශයේ පිහිටා ඇති තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැඟිල්ලක් නොමැති අතර එම තැපැල් කාර්යාලය තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වාගෙන යන බව දන්නේද;

(ii) එසේ නම්, ඉහත තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(iii) එය ඉදිකරනු ලබන කාලවකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

92/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වෙළඳපොළේ මේ වනවිට පොල් හිඟයක් පවතින බව දන්නේද;

(ii) මෑතකදී හඳුන්වා දෙන ලද, උතුරු පළාත කේන්ද්‍ර කරගත් නව පොල් ත්‍රිකෝණය හරහා ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනයට ලැබී ඇති දායකත්වය කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් පරිභෝජනය කොපමණද;

(iv) පොල් හිඟය අවම කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

125/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා අනුමත බන්ධනාගාර නියාමකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන බන්ධනාගාර නියාමකවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම තනතුරේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(v) බන්ධනාගාර නියාමකවරුන්ගේ වෘත්තීය ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

210/2024

ගරු රෝහණ බංඩාර මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට හඳුනාගෙන ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් කවරේද;

(iii) එම ස්ථානවල ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත වස්තූන් ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

392/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාව සඳහා පත් කර ඇති නව පළාත් ආදායම් කොමසාරිස්වරයා පත් කරන ලද ක්‍රමවේදය කවරේද;

(ii) පළාත් ආදායම් කොමසාරිස් තනතුර සඳහා අදාළ සුදුසුකම් කවරේද;

(iii) නව පළාත් ආදායම් කොමසාරිස්වරයා පත් කිරීමට ප්‍රථමයෙන් සිටි හිටපු පළාත් ආදායම් කොමසාරිස්වරයා, දේශීය ආදායම් සේවාවේ නිලධාරියෙක්ද;

(iv) පළාත් ආදායම් කොමසාරිස්වරයා පත් කරනු ලබන්නේ දේශීය ආදායම් සේවයෙන්ද, පළාත් ආදායම් සේවයෙන්ද, ගණකාධිකාරී සේවයෙන්ද;

(v) ඌව පළාත් සභාව සඳහා පත් කර ඇති නව පළාත් ආදායම් කොමසාරිස්වරයා මීට පෙර ඌව පළාත් සභාවේ පළාත් ආදායම් කොමසාරිස් තනතුරට පත් කර එම තනතුරෙන් ඉවත් කරනු ලැබූ නිලධාරියෙක්ද;

(vi) එසේ නම්, එම නිලධාරියා පත්කර ඇති පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?